# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2096/2 - 2018 නොවැම්බර් මස 05 වැනි සඳුදා - 2018.11.05**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය : IR/15/37/2008

**කාර්මික ආරාවුල් පනත 131 වැනි අධිකාරය**

131 වැනි අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2012.07.18 දිනැති හා අංක 1767/18 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2012.06.22 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් හෝකන්දර දකුණ, යොවුන් පෙදෙස, නො. 326/2 හි පදිංචි කේ. එන්. ආර්. සූරියබණ්ඩාර මයා, හෝමාගම, පිංකෙත පාර, අංක 647/1 හි පදිංචි ඩී. එච්. එස්. සේනානායක මයා, පන්නිපිටිය, ඇරැව්වල, අංක 661 හි පදිංචි එම්. සිතුම් මංජික මයා, කෝකිලා දිල්රුක්ෂි මිරිහාන මිය, එස්. ටී. ලංකා මිය, කේ. මංජුල පුෂ්පකුමාර මයා, වයි. එස්. මනෝජ් කුමාර මයා, එම්. එම්. ජී. එස්. බී. අභයරුවන් මයා, ජී. එස්. දමයන්ති පෙරේරා මෙනවිය යන සේවක සේවිකාවන් නව (09) දෙනෙකු හා අනෙක් පාර්ශ්වය වශයෙන් නුගේගොඩ පිහිටි ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2018.03.22 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2018 ඔක්තෝබර් මස 22 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

යොමු අංකය : IR/15/37/2008

කාර්මික අධිකරණයේ දී ය.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ
සේවයේ යොදවා ඇති.

1. කේ. එන්. ආර්. සූරියබණ්ඩාර මයා,
   අංක 326/2, යොවුන් පෙදෙස,
   හෝකන්දර දකුණ.
2. ඩී. එච්. එස්. සේනානායක මයා,
   අංක 647/1, පිංකෙත පාර, හෝමාගම.
3. එම්. සිතුම් මංජික මයා,
   අංක 661, ඇරැව්වල, පන්නිපිටිය.
4. කෝකිලා දිල්රුක්ෂි මිරිහාන මිය.
5. එස්. ටී. ලංකා මිය.
6. කේ. මංජුල පුෂ්පකුමාර මයා.
7. වයි. එස්. මනෝජ් කුමාර මයා.
8. එම්. එම්. ජී. එස්. බී. අභයරුවන් මයා.
9. ජී. එස්. දමයන්ති පෙරේරා මෙනවිය
   යන සේවක සේවිකාවන් නම (09)
   දෙනෙකු

*පළමු පාර්ශ්වය*

නඩු අංකය : A 3460 සහ

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,
නුගේගොඩ.

*දෙවන පාර්ශ්වය*

අතර පවතින කාර්මික ආරවුල සම්බන්ධ ප්‍රදානයයි.

**ප්‍රදානය**

කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍ය ගරු ගාමිණී ලොකුගේ මැතිතුමා විසින් වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(10) වන වගන්තියෙන්, කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමාට පැවරී ඇති බලතල ප්‍රකාරව උක්ත ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා 2012.06.22 වන දිනැති නියෝගයෙන් බේරුම්කරුවෙකු වශයෙන් මා පත්කොට මා වෙත යොමු කොට ඇත.

*ආරවුලට තුඩුදුන් කාරණය.*

බේරුම්කරණය සඳහා මා වෙත යොමු කොට ඇති උක්ත නියෝගය ප්‍රකාර ව ඉහත සඳහන් දෙපාර්ශ්වය අතර උද්ගත වී ඇති කාර්මික ආරවුලට හේතු වී පවත්නා කාරණය ලෙස කම්කරු කොමසාරිස්වරයා විසින් 2012.05.15 දින එවා ඇති ලිපියේ දැක්වෙන්නේ,

''ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පාලක පක්ෂය විසින් 2002.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙහි පහත නම් සඳහන් සේවක සේවිකාවන් නව (09) දෙනා පරිගණක යෙදවුම් සහකාර III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කොට එලෙස අන්තර්ග්‍රහණය කරනු ලැබූ දිනය 2007.08.01 වශයෙන් සංශෝධනය කර ඔවුන් හට ගෙවනු ලැබූ අතිරික්ත වැටුප ආපසු අය කර ගැනීම හේතුවෙන් ඔවුන්ට යම් අසාධාරණයක් සිදුවූයේ ද යන්න හා අසාධාරණයක් වූයේ නම්, ඔවුන් එකිනෙකාට කුමන සහනයක් හිමි ද යන්න පිළිබඳව වේ.''

01. කේ. එන්. සූරියබණ්ඩාර මයා,
02. ඩී. එච්. එස්. සේනානායක මයා,
03. එම්. සිතුම් මංජික මයා,
04. කෝකිලා දිල්රුක්ෂි මිරිහාන මිය,
05. එස්. ටී. ලංකා මිය,
06. කේ. මංජුල පුෂ්පකුමාර මයා,
07. වයි. එස්. මනෝජ් කුමාර,
08. එම්. එම්. ජී. එස්. බී. අභයරුවන් මයා,
09. ජී. එස්. දමයන්ති පෙරේරා මෙනවිය,

**පසුබිම**

2012.08.03 වන දින ඇමුණුම් හතක් (1-7 දක්වා) ද සමග ඉල්ලුම්කරුවන්ගේ ප්‍රකාශය ඉදිරිපත් කරන ලද අතර වග උත්තරකරුවන් වෙනුවෙන් වර්ෂ 2012.08.14 වන දින ඇමුණුම් 12 ක් සමග (R1-12 දක්වා) ප්‍රකාශය යොමු කරන ලදී. 2012.09.09 වන දින විමසීමට ගත් අවස්ථාවේදී එම්. සිතුම් මංජික ඉල්ලුම්කරුවන් වෙනුවෙන් පෙනී සිටි අතර වගඋත්තරකරුවන් වෙනුවෙන් කිසිදු පෙනී සිටීමක් නොවීය. 2012.10.25 වන දිනට දෙපාර්ශ්වයට නොතිසි නිකුත් කරන ලදී. 2012.10.25 වන දින විමසීමට ගත් අවස්ථාවේදී වගඋත්තරකාර ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය වෙනුවෙන් ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී නීතිඥ පී. කේ. සී. සෙනරත් මහත්මිය පෙනී සිටිය ද ඉල්ලුම්කරුවන් වෙනුවෙන් පෙනී සිටීමක් නොවීය. මේ අවස්ථාවේදී ඉල්ලුම්කරුවන්ගෙන් සමහර දෙනා සේවයෙන් ඉවත් වී ඇති බවත් තවත් සමහරු උසස්වීම් ලබා ඇති බවත් දන්වන ලදුව දෙසතියක් තුළ මේ සම්බන්ධයෙන් ලිඛිතව ලේඛකාධිකාරී වෙත දනුම් දීමටත් එම විස්තර අනුව දනට සේවය කරන ඉල්ලුම්කරුවන්ට පමණක් නොතිසි එවීමට නියම කරන ලදී. 2012.12.12 වන දිනට විමසීමට නියම කළ ද දෙපාර්ශ්වයෙන් කිසිදු පෙනී සිටීමක් නොවීය. නැවත 2013.01.18 වන දිනට විමසීමට නියම කරන ලදී.

2013.03.11 වන දින විමසීමට ගත් අවස්ථාවේදී නැවත විභාගය 2013.05.13 වන දිනට නියම කරන ලදී. 2013.07.26 වන දින විමසීමට ගත් අවස්ථාවේදී කේ. එන්. ආර්. සූරියබණ්ඩාර, ඩී. එච්. එස්. සේනානායක, එම්. සිතුම් මංජික, කෝකිලා දිල්රුක්ෂි මිරිහාන, එස්. ටී. ලංකා යන ඉල්ලුම්කරුවන් පස් දෙනා පමණක් පෙනී සිටින ලදී. දෙපාර්ශ්වයේම සැළකිරීම් සළකා බැලීමෙන් අනතුරුව මෙම ප්‍රශ්නය වගඋත්තරකාර පක්ෂයේ මැදිහත් වීමෙන් විසඳා ගත හැකි බවට තීරණය කරන ලදී. ඒ අනුව ඇමුණුම් අංක 07 දරන ලේඛනයට අනුව ඉල්ලුම්කරුවන්ගේ ඉල්ලීම් ලබා දීම කෙරෙහි ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරීගේ අවධානය යොමු කරන ලදී.

2013.07.26 දින බේරුම්කරණයේ මග පෙන්වීම යටතේ වගඋත්තරකාර පක්ෂය විසින් ඉල්ලුම්කරුවන් පස්දෙනා වෙනුවෙන් සහන සලසා දීමට ලිඛිතව පොරොන්දු විය. 2014.04.25 වන දින විමසීමේදී 2014.03.18 වන දින යොමු කරන ලද දැන්වීම අනුව 2014.04.21 දාතමින් යුතුව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය වෙනුවෙන් AO/D/50 අංකය යටතේ කාර්මික අධිකරණයේ ලේඛකාධිකාරී වෙත ලිපියක් එවමින් බේරුම්කරණය මගින් යොමු කරන ලද ප්‍රදානය පිළිගනිමින් විමසීම අවසන් කරන ලෙස ඉල්ලා ඇත.

ඉහත දක්වන ලද හේතුමත ඉල්ලුම්කරුවන්ගේ ඉල්ලීම් සාධාරණ සහ යුක්තිසහගත බවට නිර්දේශ කරමින් පහත ප්‍රදානය ලබා දීමට නියෝග කරමි.

*ප්‍රදානය*

1. 2002.01.01 සිට පරිගණක යෙදවුම් සහකාර තුන්වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කර ලැබිය යුතු වැටුප් සහ සියලුම දීමනා ලබා දීම, තවද වර්තමානයේ සියලුම ශ්‍රේණිගත උසස්වීම් සහ එයට හිමි වැටුප් තලයන් ලබා දීම. (2008.01.01 යෙදවුම් සහකාර II, 2012.01.01 යෙදවුම් සහකාර I තනතුරට පත් කිරීම.)

2. 2011.09.15 වන දින සිට පරිගණක යෙදවුම් සහකාර I ශ්‍රේණියේ පිහිටු වීමත්, හිඟ වැටුප් සහ අයකර ගන්නා ලද අත්තිකාරම් වැටුප් ආපසු ලබා දීමටත් අයිතිවාසිකම් ඇති බවට තීරනය කරමි.

සටහන

මෙම බේරුම්කරණ විභාගයට සෑහෙන කාලයක් ගත වූයේ දෙපාර්ශ්වයම වරින් වර දින ඉල්ලා කරන ලද ඉල්ලීම්වල ප්‍රතිඵලයක් හැටියටය, විශේෂයෙන් ම මෙම ප්‍රදානය සකස් කොට ඉදිරිපත් කිරීම ප්‍රමාද වූයේ නොවැළැක්විය හැකි අති පෞද්ගලික හේතුන් නිසා බවත් ඒ සම්බන්ධයෙන් දෙපාර්ශ්වයට ම කිසියම් අපහසුතාවයක් වූයේ නම් පෞද්ගලිකව අතිශයින්ම කණගාටුවට පත් වෙමි.

එස්. එම්. එස්. ජයවර්ධන,
බේරුම්කරු.

2018.03.22 වන දින,
කාර්මික අධිකරණයේ දී ය.

11 - 799

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.